# රූපවාහිනියේ ආසියානු රැල්ල DTH හා ඉන් ඔබ්බට

## පියදාස රත්නසිංහ

ආසියාවේ බොහෝ රටවල ආර්ථිකය 97/98 වසරවල දී විවිධ හැල හැප්පීම්වලට බඳුන් විය. සන්නිවේදන මාර්ග ද ඉන් මිදුනේ නැත. සන්නිවේදන මාර්ග සඳහා ආයෝජනය කරන්නට ඉදිරිපත් වූ බොහෝ දෙනා කිසියම් ආකාරයක පසුබෑමකට පත් වූහ. වසර දෙකකින් පමණ ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමත් සමගම සන්නිවේදන මාර්ග හසුරුවන්නෝ යළි ක්‍රියාකාරී වූහ. මෙම ලිපියෙන් විමසනු ලබන්නේ කෘත්‍රිම චන්ද්‍රිකා පාදක රූපවාහිනී සේවාවන්වල ප්‍රගතියයි.

ලෝක ජනගහනයේ වැඩි ප්‍රතිශතයක් ව්‍යාප්තව ඇත්තේ අප ද ඇතුළත් වන ආසියා කලාපයට ය. ජනගහනය වගේම ලොව වැඩිම රූපවාහිනී නිවෙස් (TV Houses) ප්‍රමාණයක් ඇත්තේ මෙම කලාපය තුළ ය. වසර තුන හතරකට පෙර බලපෑ ආර්ථික අර්බුදය නිසා මන්දගාමී වූ කේබල් රූපවාහිනී ජාල හා කෘත්‍රිම සන්නිවේදන චන්ද්‍රිකා හරහා සෘජුවම ග්‍රහණය කර ගත හැකි රූපවාහිනී සේවා (Direct to Home – DTH) සපයන්නන් යළිත් ප්‍රකෘතිමත් වී ඇත. 1999 වන විට යළි ආර්ථිකය පණ ගැන්වීම මෙම ප්‍රකෘතියට හේතු වූ බව පැහැදිලි ය.

කෘත්‍රිම චන්ද්‍රිකා පාදක රූපවාහිනී සේවාවන් පිළිබඳව මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව ආසියා ශාන්තිකර කලාපයේ රටවල ග්‍රාහකයන් මිලියන 3.4 කට සීමා විය. මෙයින් උපරිමය වන මිලියන 1.9 ක ග්‍රාහක පිරිසක් (50%) ක් ජපානය සතු ය. ජපානයේ ජාතික රූපවාහිනී සේවය (N.H.K.) පොදු සේවා විකාශයක් (Public Service Broadcast)වශයෙන් ක්‍රියාකාරී වන අතර කෘත්‍රිම සන්නිවේදන චන්ද්‍රිකා මාර්ගයෙන් රූපවාහිනී නිවෙස් මිලියන දෙලහක් වෙත සිය සේවා සපයයි. ඒ සඳහා දීසි ඇන්ටෙනා (Dish Antenna) උපයෝගී කර ගනු ලැබේ. මුදල් ගෙවා සේවා ලබා දෙන රූපවාහිනී (Pay TV) සඳහා හොඳ වෙළෙඳ පොළක් නිර්මාණය කිරීමට හොඳ පසුබිමක් තිබේ. ලොව වෙනත් රටවල් සමග සන්සන්දනය කරන විට කලාපයේ ආර්ථික තත්ත්වය ඇත්තේ පහළ මට්ටමක ය. ඇමෙරිකාවේ 70% ට සාපේක්ෂව

**ලොව වැඩිම රූපවාහිනී නිවෙස් ප්‍රමාණයක් ඇත්තේ ආසියානු කලාපය තුළ ය.**

මෙම කලාපයේ ග්‍රාහකයින් ඇත්තේ 20% කි. යුරෝපයට සාපේක්ෂව 25% කි. කලාපයේ මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතු දෙකක් අනාවරණය වේ.

1. 1997/1998 ආර්ථික පරිහානිය
2. තාක්ෂණික හේතු විශේෂයෙන් කේබල් එලීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතා.

කෙසේ වුවත් කෘත්‍රිම චන්ද්‍රිකා සන්නිවේදනයේ සහය ලබා රූපවාහිනී සේවාවන් ව්‍යාප්ත කිරීමට කලාපයේ ඇති ප්‍රවණතා බෙහෙවින් තිබේ. එහිදී ප්‍රධාන වන්නේ එහි ඇති ජනගහනයයි. 1999 අවසානය වන විට කලාපයේ රූපවාහිනී නිවාස (TV House) මිලියන 500 ක් විය. මෙය වසරකට මිලියන 10 බැගින් (වසර 2005 දක්වා) වර්ධනයකට අවකාශ තිබේ. එසේම 1999 මිලියන 1.6 කට සීමා වූ ග්‍රාහක සංඛ්‍යාව (DTH Subscribers) මිලියන 3.4 ක් දක්වා වර්ධනයක් 2000 අවසානයේ දක්නට ලැබුණි. 2005 වන විට මිලියන 33.5 ක වර්ධනයක් අපේක්ෂා කෙරේ. චීනය හා ඉන්දියාව නිදහස් රූපවාහිනී සේවාවන් සඳහා ඇති නීතිමය තත්ත්වයන් ලිහිල් කිරීමත් සමග මෙම දියුණුව පිළිබඳව බලාපොරොත්තු තැබිය හැකි ය. ඉන්දියාව දැනටමත් නීතිමය පියවර ගෙන ඇත.

දැනට ක්‍රියාත්මක DTH රූපවාහිනී සේවා ඉංග්‍රීසි කතා කරන, එයින්ම පාන්තික කණ්ඩායම් ඉලක්ක කර ගත් ඒවා ය. ඉංග්‍රීසි ප්‍රවෘත්ති, බටහිර හොලිවුඩ් චිත්‍රපට, ක්‍රීඩා තරග හෝ බටහිර සංගීත වැඩසටහන් සඳහා විවෘත ය. ඒවා දැන් කලාපයේ සංස්කෘතිය හා රුචි අරුචිකම් අනුව වැඩසටහන් නිෂ්පාදනයට පිවිස ඇත. 1997 දී ඉන්දියාව DTH සේවාවන් සඳහා තහනමක් පැනවීමට හේතු කිහිපයකි.

1. ජාතික ආරක්ෂාව
2. සංස්කෘතික බලපෑම්
3. සමාජ හා සදාචාරාත්මක බලපෑම

ඉන්දියාවේ මිලියන 60ක් වන රූපවාහිනී නිවාස (TV House) වලට තහනම බලපෑ හැකි විය. 2000 නොවැම්බර් 02 දින ඉන්දීය කැබිනට් තීරණයකට අනුව DTH රූපවාහිනී සේවාවන් ආරම්භ කිරීමට අවකාශ සලසමින් නීති සකස් විය. තාක්ෂණික දියුණුවත් සමග තවදුරටත් සීමා නියම කිරීමෙන් මැඩපැවැත්වීමට හැකියාවක් නොමැත. සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගමනය නව ප්‍රවණතාවට ඉවහල් වූ බව සිතිය හැකි ය. 20% ක් සෘජු විදේශීය ආයෝජනයක් ඇතුළුව උපරිම විදේශ ආයෝජනය 49% ක උපරිමයකට යටත්ව නව සේවාවන් ඉන්දියාව තුළ ආරම්භ කිරීමට ඉඩ ලැබේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අපට ඉන්දියාවෙන් ගත හැකි පාඩම් බොහෝ ය. ජාතික රූපවාහිනී සංස්ථාව කලක පටන් මේ පිළිබඳව සත්‍යතා සමීක්ෂණ කර ඇතත් කෘත්‍රිම චන්ද්‍රිකාවක සේවය ලබා ගැනීමට පවතින මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවේ. චන්ද්‍රිකා සන්නිවේදන තාක්ෂණික පහසුකම් ලබා ගැනීමට ඉඩකඩ ඇත්නම් දැනට පැහැදිලි සංඥා (Clear Signals) ලබා ගැනීමට අපහසු අඳුරු කලාපවල දර්ශන තත්ත්වය ඉතා දියුණු තත්ත්වයකට පත් කිරීමට පිළිවන. විවිධ ප්‍රදේශවල දර්ශන තත්ත්වය දියුණු කිරීමට පිහිටුවීමට නියමිත රූපවාහිනී කුලුනු නිසා ඇතිවන පාරිසරික ගැටලු ඇති නොවීමටත්, දිගුකාලීනව බලන විට ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයකුත් අපේක්ෂා කිරීමට පුළුවන.

ඉන්දීය නීතිමය ප්‍රතිපාදන මගින් අපට ගත හැකි ගුරුහරුකම් මොනවාද? විදේශීය ආයෝජකයින් පැමිණීම හොඳ ය. එහෙත් දැඩි පාලනයක් තිබිය යුතු ය. ඒ නිසා විය හැකි ආයෝජනවලින් සෘජුව විදේශීය ආයෝජකයින්ට පිවිසීමට ඇති සීමාව 20% කට සීමා කරන්නට ඇත්තේ බලපත්‍ර නිකුත් කිරීම සීමා කිරීමට දැනට බලාපොරොත්තු නොවෙතත් බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරී බලය වසර දහයකට ඉන්දීය රජය වෙත තබා ගැනීමට තීරණය කර ඇත. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ඇතුළත්වීමේ ගාස්තුව අමෙරිකානු ඩොලර් මිලියන 2.14 ක් හෙවත් ඉන්දියානු රුපියල් ක්‍රෝ 10 කි. වාර්ෂිකව ලැබෙන ආදායමෙන් 10%ක් සහ අමෙරිකානු ඩොලර් මිලියන 8.56 ක් නොහොත් ඉන්දියානු රුපියල් ක්‍රෝ 40 සමාන බැංකු බැඳුම්කරයකට ද එළඹිය යුතු ය. ප්‍රේක්ෂාවලි සඳහා අතිරේක ගාස්තුවක් ද ගෙවිය යුතු වේ. එසේම විකාශ ආරම්භක මධ්‍යස්ථාන ඉන්දියාවේම Up Link පිහිට විය යුතුය. දැනට ඉන්දියාවේ ක්‍රියාත්මක බොහෝ කේබල් සේවාවන් සිය සේවා ක්‍රියාත්මක කරන්නේ හොංකොං හෝ සිංගප්පූරුවේ සිට ය. උදාහරණයක් ලෙස අප ද නරඹන ඩිස්කවරි වැඩසටහන් විකාශය කරන්නේ සිංගප්පූරුවේ සිට ය. එසේම ඉන්දීය කෘත්‍රිම චන්ද්‍රිකා යොදා ගැනීමට ද අවකාශ ඇත. ඉන්දියානු සමාගම් පණත යටතේ ලියාපදිංචි විය යුතු අතර පාලනාධිකාරිය ඉන්දියානු ජාතිකයින් ගෙන් සමන්විත යුතු ය. ප්‍රධාන විධායකයා ඉන්දියානුවෙකු විය යුතු ය. අධිකාරී බලය ඇත්තේ ඉන්දීය ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ය. නීතියට අනුකූල නොවන සේවා සැපයුවහොත් ඉන්දියානු රුපියල් ක්‍රෝ 50 ක දඩයක් නියම කෙරේ. සියලුම වැඩසටහන් ඉන්දියන් වැඩසටහන් හා වානිජ පටිපාටිවලට අනුකූලව විය යුතු ය. සියලුම විකාශිත වැඩසටහන් ඕනෑම වේලාවක නැරඹීම සඳහා පටිගත කොට දින 90 ක් තබා ගත යුතු වේ. රටේ හා ජනතාවගේ ආරක්ෂාව, සුබසිද්ධිය උදෙසා විශේෂ වගකීමක් ඇති අතර ඕනෑම අවස්ථාවක වරද කරන සේවා අත්හිටුවීමට බලපත්‍ර අවලංගු කිරීමට ඉඩ තිබේ.

මූලික වශයෙන් අමෙරිකානු ඩොලර් මිලියන 537 (ක්‍රෝ 25,000) ක ප්‍රාග් ධනයක් සැලසීට ඩිෂ් Satellite Dish ග්‍රාහක උපකරණ Digital Recoder ලබා ගැනීමට හා මාසික නඩත්තුව සඳහා රුපියල් 1,000 ක ගාස්තුව අයකිරීම ඇතුළත් වේ. 79 පිටුවට

# රූපවාහිනියේ ආසියානු ... 29 පිටුවෙන්

සාමාන්‍ය ජනයාට මෙම සේවාවල පහසුකම ලබා ගැනීමට ආර්ථිකය ඉඩ සීමා කරයි.

ඉන්දියාවේ ඈත එපිට ගම්මානවල එදා වේල සපයා ගන්නටවත් හැකියාවක් නැති කාන්තාවක් තමන්ගේ තොල් සායම් කිරීම ගැන ඇසූ පැනයකට කියා සිටියේ රූපවාහිනී වැඩසටහනකින් උගත් බව ය. ඔවුන් තමන්ගේ සිරිත් විරිත්වලින් ඈත්වෙමින් බටහිර අනුකරණයට යොමුව ඇත.DTHරූපවාහිනී වැඩසටහන් ඊට බලපා නැතැයි කිව හැකි ද?

ශ්‍රී ලංකාවේ අපට තවම මෙම උණුසුම විශාල වශයෙන් දැනෙන්නට පටන් ගෙන නැත. දැනට ක්‍රියාත්මක වන සීමිත කේබල් සේවාවන් වලින් රූපවාහිනී නාලිකා කිහිපයක සේවය මුදල් ඇති, හැකි අයට රසවිඳින්නට ඉඩ ඇත. ග්‍රාහකයින් 10.000ක් පමණ සිටින මල්ටිවිෂන් සේවය හා ජීටීවී සේවය සිය කේබල් සේවා ව්‍යාප්ත කරමින් සිටී. ජීටීවී මොරටුවෙන් ආරම්භ කර ඇත්තේ ග්‍රාහක නිවාස 300 කිනි. එය කොළඹ දෙසට දෙහිවල දක්වා කේබල් එළා ඇති බව පළ වේ. නාවල ප්‍රදේශයේ තවත් සේවාවක් ආරම්භ කර ඇතත් ග්‍රාහක සංඛ්‍යාව පිළිබඳ දත්ත ලබා ගැනීමට නොමැත.

කෘත්‍රිම චන්ද්‍රිකා සන්නිවේදන රූපවාහිනී සේවාවන් නුදුරු අනාගතයේම අපට ලැබේද යන්න ස්ථිරව කිව නොහැකි වුවත් එහි ධනාත්මක හා ඍනාත්මක පළ පිළිබඳව දැනුවත්වීම සුදුසු ය. ඉදිරි ලිපියකින් මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. ❑

**Asia –Pacific Satellite**
**ඇසුරෙනි**